මාධ්‍ය නිවේදන අංක : **PRE/2024/03** **2024.07.26**

# ජනාධිපතිවරණය - 2024

**තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්වය හේතුකොට ගෙන එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති අයට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා වූ පහසුකම**

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ**

**119 ආ වැනි වගන්තිය**

තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලුම් කිරීමට 1988 අංක 16 දරන පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය යටතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත.

මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සියලුම දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි කාර්යාලවලින් ලබා ගත හැකි ය. නීත්‍යානුකූලව නාමයෝජනා දැන්වීමේ දින සිට දින 7ක් ඇතුළත දී, එනම් 2024 අගෝස්තු මස 01 දින හෝ ඊට පෙර අදාළ ඉල්ලුම්පත්‍ර මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට එවිය යුතු ය.

ඉල්ලුම්කරුවන් විසින් 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන අදාළ විස්තර ඉල්ලුම් පත්‍රවලට ඇතුළත් කළ යුතු ය. මෙම නාමලේඛනයට අදාළ තොරතුරු සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/ කච්චේරිවල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබනු ඇත. තවද, 2024 ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන ලියාපදිංචි විස්තර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද පරීක්ෂා කළ හැකිය.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිවැරදි බවට සනාථ කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් නොමිලේ ලබාගත හැකි අතර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද බාගත කළ හැකිය. ග්‍රාම නිලධාරී සහතිකය නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්